# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
# கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්.එච්. දහනායක මාවත, ගාල්ල
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச். தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S.H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } දප/සමු/කොමි/නීති/චක්‍ර | ඔබේ අංකය / உனது இல. / Your No. } | දිනය / திகதி / Date } 2015.03. 03 |

චක්‍රලේඛ අංක 01/2015

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාතේ සමූපකාර සේවකයින්ට අතිරේක දීමනාවක් ගෙවීම.</u>

2015 අය වැය යෝජනාවලට සමගාමීව දකුණු පළාතේ සමූපකාර සමිතිවල ස්ථිර පදනමින් සේවය කරන සියලු සේවකයින්ට 2015.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.2,500/- ක මාසික අතිරේක දීමනාවක් ගෙවීමට දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇති බව දන්වමි.

02. මෙහිදී පිරිස්බල තක්සේරුව අනුව කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇති සේවකයින් වෙත පමණක් මෙම දීමනාව ගෙවිය යුතු වන්නේය.

03. මෙම දීමනාව ගෙවීමෙන් සියලුම සමූපකාර සමිතිවලට වැඩිපුර දැරීමට සිදුවන අතිරේක වැය පාලක සහ සේවක දෙපක්ෂය එක්ව නව ව්‍යාපෘති හා පවතින ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම මත පාලනය කරගත යුතු බව දන්වමි.

04. මෙම අතිරේක දීමනාව සමූපකාර සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂික දීමනා, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල්වලට දායක කර නොගත යුතුය.

05. සාමූහික ගිවිසුම් මගින් හෝ අවබෝධතා ගිවිසුම් මගින් වැටුප් තීරණය කරනු ලබන සමූපකාර සමිතිවල සේවකයින්ට මෙම අතිරේක දීමනාව නොගෙවිය යුතුය.

06. සමූපකාර සේවක කොමිෂන් සභාවේ නිර්දේශිත වැටුප් නොලබන පඩිපාලක සභා වැටුප් ලබන සේවකයින්ට මෙම දීමනාව ගෙවන්නේ නම්, අදාළ ව්‍යවස්ථාපිත ආයතනයෙන් පඩිපාලක සභා වැටුප් හෝ දීමනා වැඩි කළ අවස්ථාවකදී නතර කිරීමේ කොන්දේසිය ඇතුලත් ගිවිසුමක් සමිතියත් සේවකයාත් අතර ඇති කරගෙන ගෙවිය හැකිය. පඩිපාලක සභාව විසින් වැඩි කරනු ලබන දීමනාව රු.2,500/- ඉක්මවා යන්නේ නම්, මෙම දීමනාව ගෙවීම නතර කිරීම සහ රු.2,500/- කට අඩු දීමනාවක් ගෙවීමට නියම කරනු ලැබුවහොත් එම දීමනාව හා රු.2,500/- දීමනාව අතර වෙනස ගෙවිය හැකිය.




සභාපති / தலைவர் / Chairman } 091-2234383 | ලේකම් / செயலாளர் / Secretary } 091-2234383 | පරිපාලන නිලධාරී / நிருவாக உத்தியோகத்தர் / Administrative Officer } 091-2234279 | ෆැක්ස් / பெக்ஸ் / Fax } 091-2234383 | විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail } empcommicoopsp@sltnet.lk

07. ඇතැම් සමූපකාර සමිති ස්වකීය සුභ සාධනය උදෙසා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි දැනටමත් යම් දීමනාවක් ගෙවන්නේ නම්, මෙම අතිරේක දීමනාව ඉහත අනුමත දීමනාව නොඉක්මවන පරිදි ලබා දිය යුතු අතර, අනුමත දීමනාව මෙම අතිරේක දීමනාවට වඩා අඩු වන්නේ නම්, එය රු.2,500/- දක්වා ලබා දිය යුතුය.

08. මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ ද එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

09. මෙම චක්‍රලේඛය ඔබ සමිතියේ සියලුම සේවකයින්ට දැන ගැනීමට සැලැස්විය යුතුය.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ආර්.එම්.අයි.ශ්‍රියානි එන්.විතාන.
ලේකම් (වැ.බ.),
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත.

පිටපත් -

1. ලේකම්, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන ..... සමූපකාර අමාත්‍යාංශය, දකුණු පළාත - දැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්, දකුණු පළාත - දැ.ස.
3. දිවයිනේ සියලු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් - දැ.ස.
4. දප/සමූකොමි/ච.ලේ. ගොනුවට